www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ පදවි ප්‍රාප්තිය අභියස

## On the eve of Obama's inauguration

**2009 ජනවාරි 20**

බරක් ඔබාමාගේ පදවිප්‍රාප්ති අවස්ථාව, මහජන විඥානයට ක්ලෝරෆෝම් අල්ලා නිදිගැන්වීම සඳහා සැලසුම් කල මාධ්‍යය මඟින් තානම අල්ලන මුග්ධත්වය හා මිත්‍යාව වැපිරීමේ මහා රල පහරක් සඳහා අවස්ථාව කොට ගෙන ඇත. ඉලිනොයිස්හි බනිජ්ය සෙනේට් සභිකයා ඒබ්‍රහම් ලින්කන්ගේ සිට ෆ්‍රැන්ක්ලීන් ඩිලානෝ රූස්වෙල්ට් හා බනිජ්ය මාටින් ලූතර් කිං දක්වා වූ සියල්ලන්ට සමාන කෙරෙමින් හා ඔහු ම සමාන කර ගනිමින් තිබේ. ඔබාමා ජනාධිපති ලෙස දිවුරුම් දීම දක්වා දිව යන සිදුවීම් මාලාව, එක් කොනක සිට තවත් කොනක් දක්වා ආවරනය කිරීමේ අවස්ථාව නිරීක්ෂනය කරන අයෙක් එය දෙවන පුනරාගමනයට නොඅඩු වූවක් බව සිතනු ඇත.

එවන් සිදුවීම් විවේචනාත්මක නිපුනත්වයකින් යුත් අයට මුන ගැසෙන්නේ සෑම විටම පිලිකුල් සහගතව ය. එහෙත් මේ හුලා හූප් සෙල්ලමේ උනුසුම නිසැකව ම බැස යන අතර කුනු ගොඩ ඉවතට පිස දැමුනු පසු ඉතිරිවන්නේ යථාර්තයයි. මෙහි දී බලයට පත් වන පුද්ගලයා ඇමරිකානු හා ලෝක ධනවාදයේ පෙර නොවූ විරූ අර්බුදයක කොන්දේසි යටතේ ජනාධිපතිකම උසුලනු ඇත්තේ ලෝකයේ ඇති අතිශයින්ම ප්‍රතිගාමී රාජ්‍යයෙහිය. ඔබාමා පරිපාලනයේ ප්‍රතිපත්ති තීරනය කරනු ඇත්තේ මාධ්‍යයේ ප්‍රතිරූප ගොඩනැඟීමෙන් හෝ හිස් පුරසාරම් මඟින් නොව ඔබාමා නියෝජනය කරන පන්ති අවශ්‍යතාවන්ගෙන් හා අර්බුදයේ විධානයන් මඟිනි.

ඔබාමා දැනටමත් අඟවා ඇත්තේ ඔහුගේ ප්‍රතිපත්ති සියලු අංගලක්ෂන සහිතව සමහරවිට වඩාත් දක්ෂ ලෙස ගොනු කල රූපයකින් යුත්, ඉවත්ව යන පරිපාලනයේ ප්‍රතිපත්තීන්ගේ ම අඛන්ඩතාවය බවය. ඔහු වටා රැස්ව සිටින පුද්ගලයන් අධිරාජ්‍යවාදී අපරාධ හා මූල්‍ය සෝලි වලට සම්බන්ධ වූවන්ය. ඊට ඇතුලත් බුෂ් යටතේ පෙන්ටගනයේ ප්‍රධානියාව සිටි රොබට් ගේට්ස්, ඉරාකයේ "තල්ලුව" නම් මිලිටරි වැඩ සටහනෙහි ප්‍රධානියා වූ අතර විනාශයට පත් කල එරටින්, එක්සත් ජනපද හමුදා ඉවත් කර ගැනීමේ මොනම කාල සටහනකට හෝ විරුද්ධ වූ අයෙකි.

ඔබාමා සිය මැතිවරන ජයග්‍රහනයෙන් - බුෂ් පරිපාලනයේ යුද්ධය, මර්දනය හා සමාජ ප්‍රතිගාමිත්වයේ ප්‍රතිපත්ති හෙලා දැකීමේ ජනතා රැල්ලක් වූ - පසු මාස ගනනක් කැප කලේ රිපබ්ලිකානු දක්ෂිනාංශයට ඒත්තුගැන්වීමේ හා සහතිකවීමේ කාර්යය සඳහාය. 19 වන දින නිව්යෝර්ක් ටයිම්ස් පත්‍රය වාර්තා කලේ, ඔබාමා සිය පරාජිත විරුද්ධවාදියා වන අතිශයින්ම යුදවාදී සෙනේට් සභික ජෝන් මැකේන් හට ජාතික ආරක්ෂාව පිලිබඳ ඉහල තනතුරු සඳහා තමන් නම්කල අය ගැන පරීක්ෂාකර බැලීමට ඉඩ සලසමින් ඔහුගේ අදහස් විමසූ බවයි. දකුනු කැරොලයිනා සෙනේට් සභික හා මැකේන්ගේ සහකරුවෙක් වන ලින්ඩ්සේ ග්‍රෙහැම්ට අනුව, ටයිම්ස් පත්‍රය මෙසේ සඳහන් කරයි. "මෙම බොහෝ පත්කිරීම් තමා විසින්ම සිදුකල" බව මැකේන් සිය සගයන් සමඟ පවසා ඇත. ඔබාමා 19 වන දින රාත්‍රියෙහි පැවැත්වෙන සිය දිවුරුම්දීමේ පූර්ව රාත්‍රී භෝජන සංග්‍රහයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස තෝරා ගෙන ඇත්තේ ද මැකේන්වය.

මාධ්‍ය රැවටිල්ලේ ස්වයං සංතෘෂ්ඨිය පලකිරීමේ හඬ නැඟීම සඳහා යම් හෝ පදනමක් පැවතියේ නම් ඒ, ඔබාමා ප්‍රථම අප්‍රිකානු-ඇමරිකානු ජනාධිපති වීමේ කාරනය පමනි. මෙය නිසැක ලෙසම සැතපුම් කනුවකි. එහෙත් එහි වැදගත්කම, සමාජ සමානතාවය නංවාලන ප්‍රතිපත්තිවල පුනර්ජීවනයක් සමඟ ඔහුගේ අනුප්‍රාප්තියට මොනම සමාගමක් හෝ වත්මන් ඓතිහාසික තත්වය තුල නොපැවතිය හැකිය යන කාරනය මඟින් පුලුල් ලෙස බාදනය වී තිබේ.

ඇමරිකානු පාලක පන්තිය, සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය අනන්‍යතා දේශපාලනයේ හා පීඩාවට පත්වූවන්ට සහන සැලසීමේ පදනම මත සියතට ගෙන, ඉහල මධ්‍යම පන්තික කලු ජාතිකයන් දේශපාලන සංස්ථාපිතය තුලට ඒකාග්‍රකරගත් තැන් පටන් බෙහෝ දශක ගනනාවක් ගෙවී ඇත. අප්‍රිකානු-ඇමරිකානුවන්ගේ පුලුල් බහුතරයක් ද ඇතුලු කම්කරු පන්තියේ තත්වය එක එල්ලේ පිරිහෙන තතු තුල, ඇමරිකානු සමාජයේ අති මූලික සමාජ හා පන්ති ප්‍රශ්න මඟහැරීම හා යටපත් කිරීම සඳහා යොදාගනු ලැබූ වර්ගය, ලිංගිකත්වය වැනි දේශපාලනය දේවත්වයට නැංවීමක් ඔබාමා නියෝජනය කරයි.

නිල සහයෝගය සහිත ප්‍රීති උත්සව මධ්‍යයේම ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ අපරාධයන්ගේ

මූලිකත්වය ගත් අවසාන රාජ්‍ය ලේකම්වරු දෙදෙනාම අප්‍රිකානු-ඇමරිකානුවන් වූ බව අමතක නොකල යුතුය.

නරුම ලෙස ගසාකමින් තිබෙන බනිෂ්ඨ මාටින් ලූතර් කිං පිලිබඳ මතකය, යලි සිහියට නගාගැනීම ද අවශ්‍ය කෙරේ. ඔහු ඇමරිකානු අධිරාජ්‍යවාදයේ උග්‍ර විරුද්ධවාදියෙකු මෙන්ම සමාජ සමානාත්මතාවය සඳහාවූ ශ්‍රේෂ්ඨ අරගලයේ නියෝජිතයෙකු ද විය. ඔහුගේ ඝාතනයට මාස කිහිපයකට පෙර කිං, වියට්නාම් යුද්ධය ප්‍රසිද්ධියේම හෙලාදුටු අතර ඇමරිකාව තුල ප්‍රධාන ප්‍රශ්නය වර්ගය නොව පන්තිය බව වඩ වඩාත් අවධාරනය කලේය. ''දුගී මිනිසුන්ගේ පා ගමනට'' මූලිකත්වය ගනිමින් ඔහු එම ඒත්තුගැනීම මත ක්‍රියාකිරීමට උත්සාහ කලේය. එම කාලයේදී ඔහු කම්කරු පක්ෂයක අවශ්‍යතාවය හා ඩිමොක්‍රටික් පක්ෂයෙන් කැඩී වෙන්වීමේ අවශ්‍යතාවය ද මතු කිරීමට පටන් ගත්තේය.

එවන් කිසිදු මූලධර්මයක් ඔබාමා වෙත පැවරිය නොහැකිය. ඔහු කවර කලෙකවත් මහජන අරගලයකට සම්බන්ධ වී නැති අතර සිය වැඩිහිටි ජීවිතයෙන් වැඩි කොටසක් ගෙවා දැම්මේ, මුල් අවධියේම ඔහු ඉහල දේශපාලන කරලියට ලක ලැස්ති කල ඉලිනොයිස් ඩිමොක්‍රටික් පක්ෂ යාන්ත්‍රනය තුල ඉහල නැඟීමේ වැඩකටයුතු වෙනුවෙනි. ජනාධිපති වීමේ ඔහුගේ උත්සාහයෙහි මුල් අදියරේ පටන්ම එය සංවිධානය කර මුදල් සම්පාදනය කලේ එක්සත් ජනපද දේශපාලන හා ව්‍යාපාරික සංස්ථාපිතයේ බලගතු කොටස් විසින් ය. ඔවුන් ඔබාමා දැක ගත්තේ බුෂ් පාලන කාලය තුල ඇමරිකානු අධිරාජ්‍යවාදයේ කීර්තියට හා තත්වයට එල්ලවූ විනාශකාරී පහරවලින් පසුව එක්සත් ජනපදයේ ප්‍රතිරූපය යලි වාත්තුකර ගැනීමේ උපකරනයක් ලෙසින් ය.

ලින්කන්ට හෝ ඊට පහල වැදගත්කමක් දරන රූස්වෙල්ට ඔබාමා සංසන්දනය කිරීමේ විකාරය සවිස්තරාත්මක ලෙස නිෂප්‍රභා කිරීම අවශ්‍ය වන්නේ නැත. කොස්වුව ද, කිසිදු හරයක් නැති අනඓතිහාසික සාම්‍යයන් මවාපෑමේදී, ඔවුන් මුහුනපා සිටින අර්බුදයන් වර්ධනය වන පුපුරන සුලු ස්වභාවය කිසිසේත්ම සැලකිල්ලට ගෙන නැති බව සටහන්කර ගත යුතුය. ඔබාමාගේ හරයක් නැති කථාවන්ට කිසිදු සාම්‍යයක් නොදක්වන ලින්කන්ගේ දීප්තිමත් කථිකත්වය තිබියදීම සිය පදවි ප්‍රාප්තියෙන් සති පහක් තුල ඔහු මුහුනදුන් ප්‍රතිවිරෝධයන් පුපුරා ගියේ සිවිල් යුද්ධය තුල ය.

රූස්වෙල්ට්ගේ පදවි ප්‍රාප්තියෙන් වසරක් තුල ඔහු මුහුන පෑවේ, ටොලීඩෝ, මිනියාපොලිස් හා සැන් ප්‍රාන්සිස්කෝ හි මහා වැඩවර්ජන ද ඇතුලු කම්කරු පන්තියේ දැවැන්ත අරගල මාලාවකටය. ඉන් ටික කලකට පසුව සීඅයිඕ වෘත්තීය සමිතිය ගොඩනැඟීම මඟින් බොහෝ දුරකට නැඟිටීමක ස්වභාවය ගත් වාඩිලාගැනීමේ වැඩ වර්ජනයන්ට ය.

ඔබාමා හුවා දැක්වීමේ වඩාත්ම තුච්ඡ හා ශෝචනීය ක්‍රියාකලාපය ඉටුකර ඇත්තේ නේෂන් හා එවැනිවූ තවත් මාධ්‍ය ප්‍රකාශන හා එක්වූ ලිබරලුන් හා ''වම්මුන්'' විසින් ය. ඔබාමාගේ මැතිවරන ව්‍යාපාරය තුල ඔවුන්ගේ සහභාගිත්වයත් ඔහු ''ඇමරිකානු යලි ගොඩනැඟීම'' සඳහා ව්‍යාපාරයේ නායකයා ලෙස හුවා දැක්වීමත් මඟින්, එසේ නොවූයේ නම් දේශපාලනිකව ශක්‍ය නො වියහැකිව තිබූ දක්ෂිනාංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසූහ. එයට ඇෆ්ගනිස්ථාන යුද්ධය පුලුල් කිරීම, තවත් ට්‍රිලියන ගනනක් බැංකුවලට ප්‍රතිපාදන සැපයීම හා සමාජ ආරක්ෂනය, වෛද්‍ය සහනාධාර වැනි අත්‍යවශ්‍ය සමාජ වැඩපිලිවෙලවල් කපා හැරීම ඇතුලත්ය.

කෙසේවුව ද, කම්කරු පන්තියත් මෙම අවස්ථාවාදී කොටස්වල රැවටීමේ හා ස්වයං මෝහනයේ සංයෝගයෙහි කොටස්කරුවන්වී යයි විශ්වාස කිරීම වරදක් වනු ඇත. ඔවුන් ජීවත් වන්නේ නැගෙන විරැකියාව, දුප්පත්කම හා නිවාස නොමැතිකමේ සැබෑ ලෝකයෙහිය. අව්‍යාජ වෙනසක් සඳහාවූ ඔවුන්ගේ අභිලාෂයන් ඔබාමා විසින් සඵලකරනු ඇතැයි කම්කරුවන්ට බලාපොරොත්තු පැවති තාක් දුරට පවා එය ඔවුන් අරගලයට පිවිසීමෙන් නොවලක්වනු ඇත. වැඩිකල් නොයවාම සිදුවීම් මඟින් ඔවුන්ගේ මිත්‍යාවන් කීතුකර දමා අලුත් ආන්ඩුව පැරැන්නට වඩා නොඅඩුවම තමන්ගේ සතුරෙකු බව පැහැදිලි කරනු ඇත.

අපගේ පැත්තෙන් ගත් කල, සිව් වසරකට පෙර ජෝර්ජ් ඩබ්. බුෂ් ලෝකය මත වාඩිලා සිටින යෝධ පුරුෂයෙකු ලෙස සැලකූ පිලිගත් ප්‍රඥාවේ මහිමය අපට අමතකවී නැත. අද ඔබාමා ගැලවුම් කරුවෙක් ලෙස වර්නනා කරන ''වම්මුන්'' බොහොමයක් එදා බුෂ් සර්වබලධාරී යයි ගැඹුරින්ම විශ්වාස කලහ.

ඔබාමාගේ පදවි ප්‍රාප්තිය තුල අධිකාරය දරන යථා ප්‍රශ්නය වන්නේ, ඔහු ජනාධිපති තනතුර භාර ගන්නේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආක්‍රමනකාරී ගෝලීය න්‍යාය පත්‍රය මඟින් උත්සන්න කර ඇති ඇමරිකානු ධනවාදයේ ඓතිහාසික අර්බුදයක් මධ්‍යයේය යන කාරනය යි. ජනවාරි 20 දිනෙන් පසුව 21 වන දින උදාවනු ඇත. විදේශයේදී ඇමරිකානු ධනවාදයේ උග්‍ර වන ප්‍රතිවිරෝධයන් ද ස්වදේශයේදී තියුනුවන සමාජ බෙදීම් ද මඟින් බල තැරැව්කරුවන් හා ඔවුන්ගේ ''වාම'' හවුල්කරුවන් ද කිසිසේත්ම සූදානම් නැති යම් තත්වයක් නිර්මානය කරනු ඇත. එනම් ඇමරිකානු කම්කරු පන්තියේ යලි ඉස්මතු වීමයි.

ඔබාමාගේ පදවි ප්‍රාප්තිය වනාහි, පෙර නොවූ විරූ සමාජ හා දේශපාලන නැඟිටීම්වල කාල පරිච්ඡේදයක පෙර සලකුනකි.

**බැරි ග්‍රේ විසිනි**



© www.wsws.org